**සොබාදම් උවදුරු**



කන්ද අවට නිවාස දිස්වන අයුරු

# නිදිගත මාරයා යළි අවදිවන්න සූදානම්!

ලොව පවතින කඳු තැනිතලා සහ ස්වභාවික පිහිටීම කෙරෙහි පරිසරවේදීන්ගේ මෙන් ම ජනතාවගේ ද අවධානය යොමු වන්නේ විශේෂයෙන් ම ඒවායෙහි සුන්දරත්වය හේතුවෙනි. එහෙත් සුන්දරත්වයට පමණක් සීමා කළ නොහැකි විශේෂිත වූ හේතූන් මත අතිශය ජනප්‍රිය භාවයට පත්වීමේ හැකියාවක් ඇතැම් ස්වභාවික සම්පත් සතුව ඇත. ලෝ ප්‍රකට විසූවියස් ගිනිකන්ද ද එවැන්නකි. ඉතාලියේ රෝමයට අයත් මෙම ගිනිකන්ද බොහෝ සෙයින් ප්‍රකට වූයේ එහි සොඳුරු බව නිසා නොව රුදුරු බව හේතුවෙන් ම ය.

ඉතාලියේ රෝම නගරයට යාබදව පිහිටි පොම්පෙයි සහ හර්කියුලේනියම් නගර මධ්‍යයේ සිට බලන්නෙකුට විසූවියස් ගිනිකන්ද දිස්වන්නේ ඉතා කුඩා නිනක් ලෙසිනි. එහෙත් 1944 වසරේදී මිනිස් ජීවිත විශාල ගණනක් විනාශ කර දමමින් මෙම නගර දෙක ලාවා වලින් සහමුලින් ම යටපත් කැර දැමීමට තරම් විසූවියස් ගිනිකන්ද ප්‍රබල විය.

1944 වසරේදී මෙම ගිනිකන්දේ පිපිරීම සිදු වන අවස්ථාව වන තෙක්ම එයින් සිදු විය හැකි හානිය පිළිබඳව කිසිවකුත් සතුව නිසි තක්සේරු කිරීමක් පැවතියේ නැත. ඉතා මන්දගාමී ලෙස නිශ්චලව ගලා ආ ලාවා දහරාවන් මගින් අවට ගම්මානවල නිවාස 800 ක් පමණ එද සහමුලින් විනාශ කරනු ලැබී ය. ඒ සමගින් මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව කොතෙක්දැයි මේ වනතුරුත් අනාවරණය කැරගෙන නොමැත්තේ වර්තමානයේදී සිදු කරන කැණීම් වලදී ද මිනිස් සිරුරු මතුවෙමින් පැවතීම හේතුවෙනි.


> 1944 දී මහා පිපිරුමකට ලක්වූ විසූවියස් ගිනිකන්ද දැඩි නිද්‍රාවකට පත්ව සිටින බව මෙතෙක් විද්‍යාඥයන්ගේ පොදු පිළිගැනීම විය. එහෙත් නිද සිටින අතරතුර සිය ඉදිරි පියවර සඳහා අවශ්‍ය වන පාරිසරික කරුණුවලින් ශක්තිමත් වීම සඳහා විසූවියස් යොමුව සිටින බව විද්‍යාඥයන් විසින් අනාවරණය කරගනු ලැබුයේ මෑතක දී ය

පිපිරුම් ක්‍රියාවලියකට අවශ්‍ය උණුසුම් වීමෙන් නිරන්තරයෙන් පසුවන විසූවියස් ගිනිකන්දේ මුල්ම පිපිරුම වාර්තා වන්නේ ක්‍රි. ව. 79 වසරේ දී ය. එතැන් පටන් වරින්වර පිපිරුම් තත්ත්ව ඇති වුවද 1037 වසරේදී එහි ක්‍රියාකාරීත්වය ඇනහිටීම ඇරඹිණි. එයින් වසර 600 කට පමණ පසු එනම් 1631 දී යළිත් විසූවියස් ගිනිකන්ද හදිසියේ ම පුපුරා ගිය අතර මිනිස් ජීවිත 4,000 ක් බිලිගැනීමට එම පිපිරුම සමත් විය. ඉන් අනතුරුව 1944 දී සිදුවූ පිපිරුම මෙතෙක් වාර්තාගත විශාලතම පිපිරුම වේ.

ඉහළ යන පාරිසරික උෂ්ණත්වයට සමගාමීව එම කාලසීමාවේදී විසූවියස් ගිනිකන්ද ආශ්‍රිතව ද ඉහළ උෂ්ණත්වයක් පැවැතිණි. භූගත ජලය මුළුමනින් ම සිඳී යාමකට ලක්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පොලෝ තලයේ ඉරිතැලීමක් සිදු විය.

ඉහළට විහිදී අළු, වර්ෂාවක් බවට පත්වෙමින් පොළොවට යළිත් පතිත වූයේ වර්ෂාමානයේ මිලිලීටර් 6 ක අගයක් සටහන් කරමිනි. ඒ සමගින් ලාවා ගලා යාම ඇරඹුණු අතර එයට ගොදුරු වෙමින් හාත්පස පැවැති සියල්ලක් ම විනාශ විය. ඉදිරි අපේක්ෂාවන් සහ සිහිනයන්ගෙන් පිරිපුන් අවිහිංසක මිනිසුන්, විසූවියස් දෙස සිට තමා පසුපස හඹා එන ලාවා දහරාවන් දැකීමෙන් දැඩි වික්ෂිප්ත භාවයට පත් වූවා නිසැක ය. ඊට අගනා සාධක සපයාගත හැකි කරුණු රැසක් පසුගිය දිනෙක අනාවරණය විය. ඒ 1961 වසරේදී භූ විද්‍යාඥයන් විසින් කරන ලද කැණීම්වලදී හමුවූ මළසිරුරුවල දක්නට ලැබුණු අනපේක්ෂිත ශරීර ඉරියව් ය. එම මළසිරුරු බොහොමයක මුව, දෑත් පා විද, සිටි ඉරියව් කවර පුද්ගලයකු තුළ වුවද ඇති කරන ලද්දේ අනුකම්පාව මුසු ශෝකයකි.

මෙම මහා ගිනිකඳු පිපිරීමත් සමඟ මෙම ගිනිකන්දෙහි හැසිරීම සහ ස්වභාවය පිළිබඳව විද්‍යාඥයන්ගේ දැඩි අවධානය යොමු විය. ගිනිකන්ද ආශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන ජනතාව නිරන්තරයෙන් දැනුවත් කිරීම් ද ඒ හා සමගාමීව සිදු විය. තත්ත්වය කෙතරම් භයානක හා අවදානම්කාරී ස්වරූපයක් ගත්ත ද ඒ කෙරෙහි ජනතාව තුළ




පවතින්නේ යහපත් ප්‍රතිචාරයක් නොවේ. උද්‍ය විය හැකි දරුණු තත්ත්වය පිළිබඳව ඔවුන්ගේ තක්සේරුව ඉතා සරල වූවක් බවට පත් වී තිබේ.

"කුමන සංවිධාන කුමනාකාරයෙන් ක්‍රියාත්මක වුවත් විසූවියස් ගිනිකන්ද ක්‍රියාකාරී වීම ඇරඹූ සැනින් සියල්ල එයට යටපත්ව යාවි."

මෙය විසූවියස් ගිනිකන්ද ආශ්‍රිතව පවතින ශාන්ත සෙබස්තියන් ගම්මානයේ ජනතාවගේ සහ නගරවාසීන්ගේ පොදු මතය යි. ජීවිතය සේම අනතුර ද සැහැල්ලුවට ගන්නා ඔවුන්ව දැනුවත් කිරීම සඳහා මෙතෙක් ගන්නා ලද උත්සහයන් හුදු ප්‍රහසනයන් සහ හිස් වෑයම් බවට පත්ව තිබේ.

කෙසේ වුවත් මෑතකදී විද්‍යාඥයන් විසින් අනාවරණය කරගෙන ඇති ඇතැම් කරුණු කිසිසේත් ම සුභවාදී නොවේ. හුදෙක් ම අනාගත ව්‍යසනයක අනතුරු හැඟවීම් රැසක් මේ තුළ සැඟව ඇත.

1944 දී මහා පිපිරුමකට ලක්වූ විසූවියස් ගිනිකන්ද දැඩි නිද්‍රාවකට පත්ව සිටින බව මෙතෙක් විද්‍යාඥයන්ගේ පොදු පිළිගැනීම විය. එහෙත් නිද සිටින අතරතුර සිය ඉදිරි පියවර සඳහා අවශ්‍ය වන පාරිසරික කරුණුවලින් ශක්තිමත් වීම සඳහා විසූවියස් යොමුව සිටින බව විද්‍යාඥයන් විසින් අනාවරණය කරගනු ලැබුයේ මෑතක දී ය. නව පිපුරුම් ක්‍රියාවලියකට අනුගත වෙමින් පවතින මෙය මොනයම් හෝ අවස්ථාවකදී විශාල පිපුරුමකට ලක්විය හැකි බවට ගිනිකඳු පිළිබඳ විද්‍යාඥයෝ මත පළ කරති.

1944 වූ පිපිරුමට වඩා කිහිප ගුණයකින් විශාල හා ප්‍රබල විය හැකි මෙම පිපුරුම 21 වන සියවසේ විශාලතම පිපිරුම වියහැකි බවට ඔවුහු ප්‍රකාශ කරති. ගැඹුරු භූ චලන හඳුනාගත හැකි සහ පොළොවේ උණුසුමේ වෙනස් වීම හඳුනාගත හැකි චන්ද්‍රිකා සහ උපකරණ භාවිත කරමින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල ලෙස මෙම මතයන් ඉදිරිපත්ව ඇත. නේපාල ජාතික පර්යේෂණ ආයතනයෙහි විද්‍යාඥ ගේබ්‍රියෙල් පැපාරෝ විසින් මේ පිළිබඳව වාර්තාවක් මෑතක දී එළිදක්වන ලදී. එහිදී විසූවියස් කන්ද අභ්‍යන්තරයෙහි ලාවා වරින් වර සිහිල් වෙමින් සහ උණුසුම් භාවයට පත්වෙමින් පිපිරුමකට අවශ්‍යවන වායු පද්ධතිය නිර්මාණය වෙමින් පවතින බව අනාවරණය වීමත් සමග ඉදිරි භයානක අනතුරක් පිළිබඳව ඉතාලි ජනතාවගේ දැඩි අවධානය යොමු වී ඇත.

මේ අතරතුර ප්‍රදේශවාසීන් මේ වනවිටත් මෙම ගිනිකන්දේ මතුපිට වන සාරවත් පස උපයෝගී කරගනිමින් සිය කෘෂිකාර්මික කටයුතු කැරගෙන යමින් සිටිති. එළවළු, අර්තාපල් වගාවන් ද, මල් වගාවන් ද මෙහි සිදු කෙරෙන අතර සත්ත්ව පාලනයට ද හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.


1944 දී සිදුවූ විනාශයේ ප්‍රතිඵල

1944 මහා ගිනිකඳු පිපිරුමෙන් ගලා ආ ලාවා ඝනකම් වී පොළොව මත තැන්පත් වීම සිදු විය. ඒවා ගල් අඟුරු ආකර බවට පත්ව ඇති අතර ප්‍රදේශවාසීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීම සඳහා ඉන් ලැබෙන්නේ අනල්ප සහායකි.

මෙම සියලු සාධක උපයෝගී කැරගනිමින් ජීවිතයේ හෙට දවස පිළිබඳව සිහිනයක කිමිද සිටින ජනතාව ඉන් ඇතිවිය හැකි භයානක ප්‍රතිඵලය පිළිබඳව දක්වන ඇල්මැරුණු ප්‍රතිචාරය එතරම් යහපත් නොවන බව ඉතාලියේ ජාතික පර්යේෂණ ආයතනය අනතුරු හඟවා ඇත. මෙම ගිනිකන්ද පිළිබඳව විධිමත් පර්යේෂණයක නිරත ඩෙල් පෙසෝ නම් විද්‍යාඥයාගේ අදහසට අනුව මෙහි ඇති අනතුර අවතක්සේරු කළ නොහැකි වේ. විසූවියස් හි පවතින ලක්ෂණ ඉදිරි පිපිරුමක් පිළිබඳ පූර්ණ සටහනක් පමණක් නොවන අතර මෙහි ක්‍රියාකාරිත්වයට එරෙහි ක්‍රියාකාරී විසඳුමක් සොයා ගැනීම අසීරු කරුණක් බවට පත්ව ඇත. තමා හොඳින් ම දන්නා එකම කාරණය එය බවද ඔහු විසින් ප්‍රකාශ කර තිබිණි.

වසර 58 ක් තිස්සේ දිගු නින්දකට වැටී සිටින විසූවියස් ගිනිකන්දේ ක්ෂණිකව සිදු විය හැකි පිබිදීම භයානක ප්‍රතිඵල ඇති කරනු ඇත. නේපාල හදිසි අනතුරු කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ආරක්ෂණ සැළසුමක් සකස් කොට ඇති අතර ගෙවුනු මාසය පුරා ඔවුහු ඒ පිළිබඳ පර්යේෂණවල නිතරව සිටිති. විටින් විට නිකුත්වන අනතුරු හැඟවීමේ සංඥ මගින් ජනතාව තුළ ඇති කරන්නේ එක් අපේක්ෂාවක් පමණි. එනම් පිපිරුමකට පෙර ඇති වන දුමාරය කුමන අවස්ථාවකදී විසූවියස් වෙතින් නිකුත්වේ ද යන්න ය.

ක්ෂණික අනතුරක් පිළිබඳව නිරන්තර අපේක්ෂාවන් ද, සාරවත් පස තුළින් සෞභාග්‍යමත් ජීවිතයක් ද මෙම විසූවියස් ගිනිකන්දෙන් ම උරුම කර ගත් මේ ප්‍රදේශයේ ජනතාව මරණය ද එයින් ම තමා වෙත තිළිණ කරන තුරු උපේක්ෂාවෙන් බලා නොසිටිනැයි කාටනම් කිව හැකි ද? ❑

News week ඇසුරිනි

**නෙල්කා මැදගෙදර**